VERITÉ RESEARCH
Strategic Analysis for Asia


5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# ප්‍රාග්ධන වියදම පිළිබඳ මිත්‍යාවෙහි බිඳවැටීම

වර්තමාන රජය ප්‍රාග්ධන වියදම් සඳහා ඉහළ කැපවීමක් තිබේද? යන ප්‍රශ්නය දෙසට මදක් අවධානය යොමු කරමු. ඕනෑම විශ්ලේෂකයෙකු මෙම ප්‍රශ්නයට ඉතා විශ්වාසයකින් යුතුව ඔව් යැයි පිළිතුරු ලබාදෙනු නිසැකය. මෙය රාජ්‍ය ප්‍රතිපත්තිය ප්‍රාග්ධන වියදම් පිළිබඳව දරණ සුභවාදී දැක්මෙහි ප්‍රතිඵලයකි. උදාහරණයක් ලෙස මහින්ද චින්තන ඉදිරි දැක්ම - 2010 ප්‍රතිපත්තිය මගින් මෙසේ දක්වා ඇත, "ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් 33% - 35% අතර මට්ටමකට ඉහළට ගෙන ඒමට අපේක්ෂිත අතර රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂිපාදනයෙන් 6% - 7% අතර මට්ටමක රඳවා ගැනීමට රජය කැපවීමෙන් ක්‍රියා කිරීමට කටයුතු කරනු ඇත" (mahinda chinthana vision for the future - 2010, පිටු අංක 03). මෙම වාර්තාවෙහිම (පිටු අංක 5) සමස්ත අයවැය හිගය දළ දේශීය නිෂ්පාදනයෙන් 5% ක මට්ටමක පවත්වාගෙන යෑමට අපේක්ෂිත බව දක්වා තිබේ.

සාරාංශක් ලෙස ගත්විට මෙය ප්‍රාග්ධන වියදමෙහි කප්පාදුවකින් තොරව අයවැය හිගය පහතට ගෙන ඒම සඳහා වන පොරොන්දුවකි. රජයේ නිල ස්ථාවරය වන්නේ මෙම පොරොන්දු ඉටු කිරීමෙහිලා රජය සාර්ථක වී ඇති බවයි. කෙසේ වුවද දත්ත විශ්ලේෂණය කළ විට පැහැදිළිවන යථාර්තය නම් පසුගිය දශක කිහිපයක් තුළ ප්‍රාග්ධන වියදම් හා සන්සන්ධනයේදී පශ්චාත් යුධ අවධියේ ප්‍රාග්ධන වියදම් වාර්තාගත අඩු අගයක් ගන්නා බවයි. ( රූප සටහන 01 )

**රූප සටහන 01: ප්‍රාග්ධන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ( සිවු අවුරුදු සාමාන්‍ය අගයන් )**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ( 2012 ) සහ 2014 අයවැය කතාව

මෙම මගින් දත්ත විශ්මය දනවන නිගමනයන් දෙකක් පිළිඹිබු කරයි. පළමු කරුන වන්නේ යුද්ධය ඉතා දරුණු ලෙස පැවති 2006 - 2009 කාල පරාසයට සාපේක්ෂව පශ්චාත් යුධ සමය (2010 - 2013 දක්වා කාලය) තුළ ප්‍රාග්ධන වියදම් අඩු අගයක් ගන්නා බවයි. දෙවෙනි කරුණ වන්නේ පශ්චාත් යුධ සමය තුළ ප්‍රාග්ධන වියදම, 1962 සිට සිවු අවුරුදු සාමාන්‍ය අගයන් හා සසඳා බැලීමේදී සාපේක්ෂ ලෙස පහත අගයක පවතින බවයි.

රාජ්‍ය අයවැය හිගය අපේක්ෂිත ලෙස සාර්ථකව පහළ මට්ටමකට ගෙන ඒමට රජය සමත් විය. කෙසේ වුවද ප්‍රාග්ධන වියදමෙහි කප්පාදුවකින් තොරව අපේක්ෂිත අයවැය ඉලක්කයන් කරා ලගාවීමේ ඉලක්කය සාර්ථකකර ගැනීමට තිබූ අපේක්ෂාවන් බිඳවැටී ඇත.

ඉහළ ආර්ථික වර්ධන වේගයක් රඳවා ගැනීමට ආයෝජනය ඉහළ මට්ටමක රඳවා ගැනීම අතිශය තීරණාත්මක සාධකයක් වේ. මෙහිදී රජයට හා පෞද්ගලික අංශයට ආයෝජන සඳහා දායකත්වය ලබාදිය හැකි අතර රාජ්‍ය ආයෝජනය හා පෞද්ගලික ආයෝජනය ලෙස මෙම දායකත්වයන් ආයෝජන මූලාශ්‍රය අනුව වෙන්කොට දැක්විය හැකිය.

වර්තමානයේදී ශ්‍රී ලංකාව අපේක්ෂා කරන ආර්ථික වර්ධන වේගය රඳවා ගැනීමට නම් දළ දේශීය නිෂ්පාදනයෙන් 30% ක පමණ ආයෝජන මට්ටමක් පවත්වාගෙන යෑම අනිවාර්ය වේ. 2012 දී පෞද්ගලික අංශයේ ආයෝජනය දළ දේශීය නිෂ්පාදනයෙන් 23.7% ක පමණ අගයක් ගත් අතර විදේශ සෘජු ආයෝජනය දළ දේශීය නිෂ්පාදනයෙන් 1% ක් වැනි ඉතා කුඩා අගයක් ගන්නා ලදි. මෙවැනි සන්ධර්භයක් තුළ රාජ්‍ය ආයෝජනය අපේක්ෂිත මට්ටමෙහි පවත්වාගෙන යෑම ආර්ථික වෘද්ධිය සම්බන්ධව ඉතා තීරණාත්මක සාධකයක් ලෙස බලපානු ලැබේ.

සුභවාදී ආර්ථික දැක්මක් තිබූ පමණින්ම ආර්ථික සුභ සිද්ධිය ලගාකරගත නොහැකිය. ප්‍රාග්ධන වියදම රාජ්‍ය ආදායමෙහි අනුපාතයක් ලෙස ගණනය කොට දැක්වූ විට පෙනී යන්නේ පශ්චාත් යුද සමය තුළ මෙම අනුපාතය වර්ධනීය ප්‍රවණතාවයක් දක්වා ඇති බවයි. (රූප සටහන 02) කෙසේ වුවද මෙම කාලය තුළ රාජ්‍ය ආදායම සැලකිය යුතු මට්ටමකින් අඩු වීමකට භාජනය වීම හේතුකොටගෙන දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම ද අඩු වීමකට භාජනය වී ඇත.


රාජ්‍ය ප්‍රතිපත්තියෙහි දක්වා ඇති ආකාරයට ආයෝජනය ඉහළ නංවා ගැනීමටත් අයවැය හිගය පහතට ගෙන ඒමටත් ඉතා පැහැදිළි උපාය මාර්ගික ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීම වැදගත් වේ. මේ සඳහා රාජ්‍ය ආධායම් මට්ටම ඉහළ නංවා ගතහැකි මූලාශ්‍ර දියුණු කිරීමත් , අත්‍යවශ්‍ය නොවන නාස්තිකාර වියදම් කපා හැරීමත් ඉතා වැදගත් වේ.

නමුත් වර්තමානයේ ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ බදු සහන හා විරාම ලබා දී ඇති ආකාරයත් , බදු පරිපාලනයත් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස සිදු නොවීම හේතුවෙන් රාජ්‍ය ආදායම දැඩි බිඳ වැටීමකට භාජනය වී තිබේ. උදාහරණයක් ලෙස පශ්චාත් යුද සමය තුළ රාජ්‍ය

ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් 14% ක් වැනි අඩු අගයක් ගෙන ඇත. මෙය යුද්ධය නිම වීමට පෙර අවධියෙහි සෑම විටම 16% (සිවි අවුරුදු සාමාන්‍යයන්) ඉක්මවූ අතර මෙම සැසඳීමෙන් රාජ්‍ය ආදායමෙහි බිඳ වැටීම මනාව පැහැදිළි වේ.

තවද පාඩු ලබන නිසි සැළසුමකින් තොරව ක්‍රියාත්මක වන (මිහින් ලංකා වැනි) ව්‍යාපෘති සඳහා දිගින් දිගටම අයවැය තුළින් ප්‍රතිපාදන ලබාදීම තුළ සීමිත රාජ්‍ය ආදායම ඵලදායී ලෙස යොදා ගැනීමට ඇති අවකාශයද හීනවීමකට භාජනය වී ඇත. එමෙන්ම මෙවැනි ඵලදායී නොවන වියදම් කපා හැරීමට රජය විසින් උත්සාහ දරණ බවක්ද දක්නට නොලැබේ. මෙම කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ රාජ්‍ය අයවැය හා ආර්ථික ප්‍රතිපත්තිය මෙහෙයවන ආකාරයෙහි විශාල අඩු ලුහුඬුකම් පවතින බවයි.

**රූප සටහන 02: ප්‍රාග්ධන වියදම රාජ්‍ය ආදායමෙහි අනුපාතයක් ලෙස**




**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**